# ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - 2012/13

## සමීක්ෂණ වර්ෂයේ පළමු මාස තුනෙහි වටය සඳහා
## (ජුලි, අගෝස්තු, සැප්තැම්බර්- 2012)
## ප්‍රාරම්භක ප්‍රතිඵල

2013 ජුනි

ISSN-2279-3968

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## දළ විශ්ලේෂණය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින්, ජාතික ගෘහ ඒකක සමීක්ෂණ වැඩ සටහන යටතේ පවත්වනු ලබන ප්‍රධාන සමීක්ෂණයක් ලෙස ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය හැඳින්විය හැක. මෙම සමීක්ෂණය 1990 වසර දක්වා ශ්‍රමබල හා සමාජ ආර්ථික සමීක්ෂණය නමින් ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය හා ඒකාබද්ධව පවත්වනු ලැබීය.

1990 සිට ශ්‍රමබල සමීක්ෂණයෙන් වෙන්ව, වෙනම සමීක්ෂණයක් ලෙස ආරම්භවූ ආදායම් හා වියදම් සමීක්ෂණය 2006/07 වසර දක්වාම වසර 5 කට වරක් පවත්වනු ලැබිය. වේගයෙන් වෙනස්වන ආර්ථික තත්වයන් හමුවේ ශ්‍රී ලාංකීය ජනතාවගේ ආදායම් හා වියදම් රටාවන් නිරීක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳ වූ ඉල්ලුම සපුරාලීමට 2009/10 සිට වසර 3 කට වරක් ආදායම් හා වියදම් සමීක්ෂණය පැවැත්වීමට දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලදී.

ශ්‍රී ලංකාවේ ආදායම්, වියදම් හා පරිභෝජන රටාවේ කාලීන වෙනස්වීම් ඇති බැවින්, එය පැහැදිලිව නිරීක්ෂණය කරනු වස්, මෙම සමීක්ෂණය අඛණ්ඩව අනුගාමී මාස 12 ක් තුල සිදු කරනු ලබයි. දිස්ත්‍රික් මට්ටමින් ඉතා විශ්වාසනීය දත්ත ලබා ගැනීමට ප්‍රමාණවත් වන පරිදි, නිවාස ඒකක 25,000 ක නියැදියක් සමීක්ෂණය සඳහා තෝරා ගැනේ. 2012/13 වර්ෂවලදී පැවැත්වූ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය, මෙම සමීක්ෂණ මාලාවේ 8 වැනි සමීක්ෂණයයි. දත්ත රැස් කිරීමේ ක්ෂේත්‍ර කටයුතු 2012 ජුලි මාසයේ සිට 2013 ජුනි මාසය දක්වා සිදු කරනු ලැබීය.

සමීක්ෂණය සඳහා භාවිතා කළ උපලේඛනය 2006/07 වර්ෂවලදී විශාල වැඩි දියුණු කිරීමක් සිදුකල අතර,



කොටස් 9 කින් සමන්විත සංශෝධිත ආදායම් හා වියදම් සමීක්ෂණ උපලේඛනයෙන් පහත සඳහන් තොරතුරු ආවරණය කෙරේ.

i. ප්‍රජා විද්‍යාත්මක තොරතුරු
ii. පාසල් අධ්‍යාපනය
iii. සෞඛ්‍ය
iv ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වියදම
v. ආදායම
vi. ගෘහ ඒකකය සතු කල් පවතින භාණ්ඩ
vii. මූලික පහසුකම් ලබාගත හැකි ප්‍රවේශ සහ ගෘහ ඒකකයේ ණය ගැතිභාවය.
viii. නිවාස පිළිබඳ තොරතුරු
ix. ඉඩම් අයිතිය සහ සත්ව පාලනය

### සමීක්ෂණය මගින් ආවරණිත ප්‍රදේශ

දිවයිනේ සියළු දිස්ත්‍රික්ක අතරින් තෝරාගත් නිවාස ඒකක 5,431 න්, පළමු මාස 3 තුල (2012 ජුලි, අගෝස්තු සහ සැප්තැම්බර්) සමීක්ෂණය සඳහා ලබා ගත් තොරතුරු ඇසුරින් මෙම ප්‍රකාශනය සකස්වී ඇත.

අවුරුදු 26 කට පසු සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මෙම සමීක්ෂණය සඳහා සාර්ථකව තොරතුරු ලබා ගැනීමට හැකිවිණි.

මුළු දිවයිනම ආවරණය කළ අවසන් සමීක්ෂණය (මෙම සමීක්ෂණය හා සබැඳි - ශ්‍රමබල හා සමාජ ආර්ථික සමීක්ෂණය) 1985/86 වර්ෂවලදී පවත්වා ඇත.

### සමීක්ෂණයේ ප්‍රධාන අරමුණු

1. ජනතාවගේ ජීවන තත්වයන්. එහි විවිධ වූ මට්ටම් සහ වෙනස්වීම් නිරීක්ෂණය.
2. පරිභෝජන රටාව නිරීක්ෂණය කිරීම
3. මිල දර්ශකාංක, දරිද්‍රතාවය වැනි මානව සංවර්ධන සහ සමාජ ආර්ථික දර්ශක

**විශේෂ කරුණු**

**ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය - 2012**

- සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම
- ☛ රු. 46,207
- මධ්‍යස්ථ මාසික ගෘහ ඒකක ආදායම
  - ☛ රු. 30,400
- සාමාන්‍ය මාසික ඒක පුද්ගල ආදායම
  - ☛ රු. 11,932
- ආදායම් ලබන්නන්ගේ සාමාන්‍ය මාසික ආදායම
  - ☛ රු. 25,778
- සාමාන්‍ය මාසික ගෘහ ඒකක වියදම
  - ☛ රු. 40,887
- ගෘහ ඒකකයක ප්‍රමාණය
  - ☛ පුද්ගලයින් 3.9
- ගෘහ ඒකකයක් තුල සිටින ආදායම් ලබන්නන් සංඛ්‍යාව
  - ☛ පුද්ගලයින් 1.8

### ඇතුල් පිටු

*ජනගහනය* 2

*පාසල් අධ්‍යාපනය* 2

*සෞඛ්‍ය* 2

*ගෘහ ඒකක ආදායම* 3

*ගිණි සංගුණකය* 3

*ඒක පුද්ගල ආදායම* 3

*ආදායම් ලබන්නන්ගේ ආදායම* 4

*ගෘහ ඒකක වියදම* 4

*ආහාර ද්‍රව්‍ය සඳහා වියදම් රටා* 5

*ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වන වියදමෙහි වෙනස්වීම.* 6


*පිටුව 2*

## ජනගහනය

2012 වසර වන විට ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත ගෘහ ඒකක ජනගහනය මිලියන 20.2 ක් ලෙස සමීක්ෂණය මගින් ඇස්තමේන්තු විය. වාසය කරන ප්‍රදේශ අංශ අනුව සැලකීමේදි ගෘහ ඒකක ජනගහනයෙන් 78% ක්, එනම් ප්‍රමාණයෙන් මිලියන 15.7 ක් වාසය කරන්නේ ග්‍රාමීය අංශය තුලය. ශ්‍රී ලංකාවේ වතු අංශයේ ජනගහනය මිලියන 0.9 පමණ වන අතර, එය මුළු ජනගහනයෙන් 5% ක් පමණ වෙයි. නාගරික අංශයේ ජනගහනය මිලියන 3.6 ක් ලෙස වාර්තාවේ.

ශ්‍රී ලංකාවේ කාන්තා ජනගහනය පුරුෂ පක්ෂයට වඩා වැඩිය. සමස්ත කාන්තා ජනගහනය මිලියන 10.7 කි. කෙසේ නමුත් නාගරික හා වතු අංශ තුල කාන්තා හා පිරිමි ජනගහන ව්‍යාප්ති රටා අතර ප්‍රමාණාත්මක වෙනසක් දක්නට නොමැත.

**රූපය 1 : ශ්‍රී ලංකාවේ ගෘහ ඒකක ජනගහනය - 2012**




**වගුව 1: ස්ත්‍රී පුරුෂ භාවය හා අංශ අනුව ගෘහ ඒකක ජනගහනය (මිලියන) - 2012**

| | ස්ත්‍රී පුරුෂ භාවය | | |
|---|---|---|---|
| අංශය | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| **ශ්‍රී ලංකාව** | **20.2** | **9.5** | **10.7** |
| නාගරික | 3.6 | 1.7 | 1.9 |
| ග්‍රාමීය | 15.7 | 7.4 | 8.3 |
| වතු | 0.9 | 0.4 | 0.5 |

## පාසල් අධ්‍යාපනය

රජයේ, පුද්ගලික, ජාත්‍යන්තර හෝ විධිමත් අධ්‍යාපනයක් ලබාදෙන වෙනත් පිළිගත් අධ්‍යාපනික ආයතනයක දැනට ඉගෙනුම ලබන දරුවන් මෙම විශ්ලේෂණයේදි දැනට පාසල් යන දරුවන් ලෙස ගණන් ගැනුණි. ඒ අනුව අවු: 5-14 වයසේ පසුවන දරුවන්ගෙන් 98.7% ක්ම දැනට පාසල් යන බවට තොරතුරු ලැබිණි.

ග්‍රාමීය අංශයේ 99.0% ක ප්‍රතිශතයකින් දරුවන් පාසල් යන අතර, අනෙක් අංශ දෙකෙහිම දැනට පාසල් යන ප්‍රතිශතය ආසන්න වශයෙන් එකම අගයක් ගනී.

ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 5-14 අතර දරුවන් අනිවාර්යයෙන් පාසල් යා යුතු වයසේ දරුවන් බවට සලකනු ලබන අතර දැනට පාසල් යන ලෙස අර්ථ දක්වනු ලබන්නේ රජයේ, පුද්ගලික, ජාත්‍යන්තර හෝ වෙනත් පිළිගත් පාසලක අවු: 5-14 වයසේ පසුවන දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමයි.

" අධ්‍යාපනය නම් ශාකයේ මුලය තිත්ත නමුත් එහි ඵල ඉතා ප්‍රණීතය"

-ඇරිස්ටෝටල්-

**වගුව 2 : අංශ අනුව වයස අවුරුදු 5-14 අතර දරුවන්ගේ පාසල් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිශත ව්‍යාප්තිය - 2012**


| අංශය | එකතුව | දැනට පාසල යන | කිසිදා පාසල් නොගිය | කවදා හෝ පාසල් ගොස් ඇති |
|---|---|---|---|---|
| **ශ්‍රී ලංකාව** | **100.0** | **98.7** | **0.6** | **0.7** |
| නාගරික | 100.0 | 97.5 | 1.5 | 1.0 |
| ග්‍රාමීය | 100.0 | 99.0 | 0.4 | 0.5 |
| වතු | 100.0 | 97.6 | 0.9 | 1.6 |

## සෞඛ්‍ය

ගෘහ ඒකකයේ සාමාන්‍ය පදිංචි සියළුම පුද්ගලයින්ගෙන් සෞඛ්‍ය පිළිබඳ අදාල තොරතුරු ලබා ගැනීම යොමු කාල 2 ක් සලකමින් සිදු කරනු ලැබිය.

ඒ අනුව, පසුගිය මාසය තුල රජයේ හෝ පුද්ගලික රෝහලකින් හෝ වෛද්‍ය ආයතනයකින් බාහිර ප්‍රතිකාර ලබා ගැනීමක් හෝ පසුගිය වසර තුල රජයේ හෝ පෞද්ගලික රෝහලකින් නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීමක් පිළිබඳව විමසන ලදි. ගෘහ ඒකක ජනගහනයෙන් 31.7% ක් මසක් ඇතුලත බාහිර රෝගීන් ලෙස ප්‍රතිකාර ලබා තිබූ බවට සමීක්ෂණය මගින් තොරතුරු අනාවරණය විය.

**රූපය 2 : අංශය අනුව ගෘහ ඒකකයේ පදිංචි පුද්ගලයින්ගේ සෞඛ්‍ය තත්වයන්හි ප්‍රතිශතය - 2012**



## ගෘහ ඒකක ආදායම


මුල්‍යමය හෝ මුල්‍යමය නොවන ආකාරයෙන් ගෘහ ඒකකයේ සියළුම සාමාජිකයන්ට ලැබුණු සම්පූර්ණ ආදායම ගෘහ ඒකකයේ ආදායම ලෙස සලකනු ලබයි.

ඒ අනුව, වැටුප් හෝ වේතන වලින් ලැබුණු ආදායම පමණක් නොව, කෘෂිකාර්මික හෝ කෘෂිකාර්මික නොවන කටයුතු කිරීමෙන් ලද ආදායම්, විශ්‍රාම වැටුප්, ආබාධිත හෝ වෙනත් සහන දීමනා, දේපල, කුලී වලින් හෝ ලාභාංශ, පොලී මගින් ලද ආදායම් වන්දි ලැබීම් හෝ ලොතරැයි දිනුම් හිමිවීම වැනි අහඹු ලැබීම් ඇතුළු සියළු ලැබීම්. ආදායම් ලෙස එකතු කරන ලදි.

සමීක්ෂණ ප්‍රතිඵල අනුව 2012 වසරේ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම රු. 46,207 ක් ලෙස ඇස්තමේන්තු විය. 2009/10 වසරේ මෙම ආදායම ලෙස වාර්තා වුයේ රු. 36,451 කි. ඒ අනුව වසර දෙක හමාරක කාල පරාසයක් තුල ගෘහ ඒකක සාමාන්‍ය මාසික ආදායම පවතින මිල ගණන් අනුව සැලකිමේදි 26.8% කින් ඉහළ ගොස් තිබෙනු නිරීක්ෂණය කළහැකි විය. කෙසේ වෙතත්, එම කාලය තුල මූර්ත ආදායම (මිලෙහි උද්ධමනය මත සකසන ලද) 5.5% ක වැඩිවීමක් පෙන්නුම් කර තිබුණි.

2012 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ගෘහ ඒකක මධ්‍යස්ථ මාසික ආදායම රු. 30,400 ක් ලෙස 2009/10 වසරට වඩා 28% ක වැඩිවීමක් පෙන්නුම් කරන අතර, මූර්ත මධ්‍යස්ථ ආදායම 2009/10 සිට 2012 දක්වා 6.4% ක වැඩිවීමක් වාර්තා කරයි.

**රූපය 3 : නාමමාත්‍ර මධ්‍යන්‍ය මාසික ආදායම සහ මූර්ත මාසික ආදායම (2006/07-2012/13)**




සටහන : මූර්ත අගයන් සඳහා පාදක වර්ෂය 2006/07

**වගුව 3 : සාමාන්‍ය මාසික මධ්‍යස්ථ ආදායම සමීක්ෂණ වසර අනුව**

| | සමීක්ෂණ කාලය | |
|---|---|---|
| මාසික මධ්‍යස්ථ ආදායම | 2009/10 | 2012 |
| නාමමාත්‍ර මධ්‍යස්ථ ආදායම (රු.) | 23,746 | 30,400 |
| මූර්ත මධ්‍යස්ථ ආදායම (රු.) | 17,207 | 18,313 |

2012 වසරේදී නාගරික අංශය තුල සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම 2009/10 සමීක්ෂණයට සාපේක්ෂව 43% ක වැඩිවීමක් පෙන්නුම්කර තිබුණි. (රු. 47,783 සිට රු. 68,336 දක්වා)

කෙසේ වෙතත්, ගෘහ ඒකක මධ්‍යස්ථ ආදායමේ අනුරූපී වැඩිවීම 2009/10 දී රු. 31,000 සිට 2012 දි රු.41,958 දක්වා 35.3% කි.

2012 වසරේදී වතු අංශය තුල සාමාන්‍ය මාසික ගෘහ ඒකක ආදායම 2006/07 ට සාපේක්ෂව 32% ක වර්ධනයක් වාර්තා කළේය. (රු. 24,162 සිට 31,895 දක්වා) එම කාල වකවානුව තුල වතු අංශයේ මධ්‍යස්ථ ගෘහ ඒකක ආදායමද රු. 17,366 සිට 25,664 දක්වා 47.8% කින් වර්ධනයවී තිබුණි.

## ගිණි සංගුණකය

ආදායම් විෂමතා පැහැදිලි කර ගැනීමට නොයෙකුත් සිද්ධාන්ත පවති. ඒ අතරින් බහුලව යොදාගනු ලබන මිණුමකි ගිණි සංගුණකය. ගිණි සංගුණකයේ අගය 0 ත් 1 ත් අතර අගයක් ගනී. 0 මගින් ආදායම් ව්‍යාප්තියේ සම්පූර්ණ සමානතාවයද 1 මගින් උපරිම විෂමතාවයද දක්වනු ලැබේ.

2012 සමීක්ෂණයෙන් ගණනය කරන ලද ජාතික ගිණි සංගුණතා අගය 0.48 කි. එය 2009/10 සමීක්ෂණයේදි වාර්තාවු අගය වන 0.49 ට වඩා ස්වල්ප වශයෙන් අඩු අගයකි.

**වගුව 4 : ගෘහ ඒකක මාසික මධ්‍යන්‍ය ආදායම සහ මාසික මධ්‍යස්ථ ආදායම**

| අංශය | මධ්‍යන්‍ය ආදායම | මධ්‍යස්ථ ආදායම |
|---|---|---|
| ශ්‍රී ලංකාව | **46,207** | **30,400** |
| නාගරික | 68,336 | 41,958 |
| ග්‍රාමීය | 42,184 | 28,921 |
| වතු | 31,895 | 25,664 |

**වගුව 5 : අංශයන් අනුව සහ සමීක්ෂණ වර්ෂ අනුව ගෘහ ඒකක ආදායම්හි ගිණි සංගුණකය**

| | සමීක්ෂණ කාලය | | |
|---|---|---|---|
| අංශය | 2006/07 | 2009/10 | 2012 |
| ශ්‍රී ලංකාව | **0.49** | **0.49** | **0.48** |
| නාගරික | 0.54 | 0.49 | 0.51 |
| ග්‍රාමීය | 0.46 | 0.48 | 0.47 |
| වතු | 0.57 | 0.42 | 0.39 |

සමීක්ෂණය පැවති පසුගිය වර්ෂවලදී වාර්තා වු පරිදි අංශයන් අනුව ගෘහ ඒකක ආදායම්හි ගිණි සංගුණකය සඳහා වාර්තාවූ අගයන් වගුව 5 න් දක්වා ඇත. නාගරික, ග්‍රාමීය හා වතු අංශවල ගිණි සංගුණක පිළිවෙලින් 0.51, 0.47 සහ 0.39 ලෙස වාර්තා විය.



## ඒක පුද්ගල ආදායම

කිසියම් ප්‍රදේශයක සියළු ගෘහ ඒකකවලට ලැබුණු සම්පූර්ණ ආදායම එම ප්‍රදේශයට අයත් මුළු ජනගහනයෙන් බෙදීමෙන් ඒක පුද්ගල ආදායම තීරණය කරනු ලබයි. එමගින් රටක හෝ ප්‍රදේශයක ජීවන තත්වය පිළිඹිබුවේ. ඒ අනුව, 2012 සමීක්ෂණයෙන් වාර්තාවු ශ්‍රී ලංකාවේ මාසික ඒක පුද්ගල ආදායම රුපියල් 11,932 කි. 2009 /10 සමීක්ෂණයේදි එය රුපියල් 9,104 ක් වශයෙන් වාර්තාවි තිබු බැවින්, එම වසරට සාපේක්ෂව 2012 වසරේ ඒක පුද්ගල ආදායම 31% ක වර්ධනයක් පෙන්නුම් කරයි. අංශ අතුරින් නාගරික අංශයේ ඉහළ මධ්‍යන්‍ය (සාමාන්‍ය) හා මධ්‍යස්ථ ඒක පුද්ගල ආදායම රු. 17,150 සහ රු. 10,167 ලෙස වාර්තා විනි.

*පිටුව 4*

## ආදායම් ලබන්නන්ගේ ආදායම

පුද්ගල මට්ටමින් ආදායම් ලබන්නන්ගේ ආදායම ලබා ගැනීම වෙනුවට ගෘහ ආදායම් හා වියදම් සමීක්ෂණයේදී සියළු ප්‍රභවයන් ගෙන් ගෘහ ඒකකය වෙත ලැබෙන ආදායම සලකනු ලැබේ. "ආදායම් ලබන්නා" යන්න අර්ථ දක්වන්නේ අවුරුදු 10 හෝ ඊට වැඩි මුළු මාසික ආදායම රු. 200 හෝ ඊට වැඩියෙන් උපයන්නන් බැවින් ඊට අඩු ආදායම් ලබන්නන් කිසියම් ගෘහ ඒකකයක වෙතොත් ඒවා අනුරූපී ගෘහයේ ගෘහමූලිකගේ ආදායමට එකතු කරනු ලැබේ.

සමීක්ෂණ ප්‍රතිඵල අනුව 2012 දී වාර්තාවූ ශ්‍රී ලංකාවේ ආදායම් ලබන්නන්ගේ සාමාන්‍ය මාසික ආදායමේ මධ්‍යන්‍ය අගය රු. 25,778 ක් විය. එය 2009/10 සමීක්ෂණයේ වාර්තාවූ රු. 20,427 ට සාපේක්ෂව 26% ක වර්ධනයකි.

ගෘහ ඒකකයක, ආදායම් ලබන්නන්ගේ සාමාන්‍ය ගණන 1.8 ක් ලෙස වාර්තාවූ අතර, 2006/07 සමීක්ෂණයේදී වාර්තාවූ එම අගයම මේ දක්වාම නොවෙනස්ව පවතී.

අංශයන් අතර සංසන්දනය කිරීමේදී වතු අංශය තුල ආදායම් ලබන්නන්ගේ මධ්‍යන්‍ය ආදායම් මට්ටමට වඩා නාගරික අංශය තුල ආදායම් ලබන්නන්ගේ මධ්‍යන්‍ය ආදායම දෙගුණයකට වඩා වැඩිව පැවතුණි. ඒ කෙසේ වෙතත්, වතු අංශයේ ගෘහ ඒකකයේ ආදායම් ලබන්නන්ගේ සංඛ්‍යාව අනෙක් අංශ දෙක සමග සසඳන විට වැඩි අගයක් පෙන්නුම් කරයි. ආදායම් ලබන්නන්ගේ මාසික මධ්‍යස්ථ ආදායම 2012 දී 16,210 ක් වන අතර, එය 2009/10 දී වාර්තාවූ රු. 12,500 ට වඩා 29.7% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

**වගුව 6 : අංශයන් අනුව ගෘහ ඒකකයේ ප්‍රමාණය, ගෘහ ඒකකයේ ආදායම් ලබන්නන්ගේ සංඛ්‍යාව, ආදායම් ලබන්නන්ගේ සාමාන්‍ය මාසික ආදායම හා මධ්‍යස්ථ ආදායම - 2012**

| අංශය | මධ්‍යන්‍ය ආදායම (රු.) | මධ්‍යස්ථ ආදායම (රු) | ගෘහ ඒකකයේ ආදායම් ලබන්නන්ගේ සංඛ්‍යාව | ගෘහ ඒකකයේ ප්‍රමාණය (පුද්ගලයින් ගණන) |
|---|---|---|---|---|
| **ශ්‍රී ලංකාව** | **25,778** | **16,210** | **1.8** | **3.9** |
| නාගරික | 36,174 | 21,000 | 1.9 | 4.0 |
| ග්‍රාමීය | 24,079 | 15,771 | 1.7 | 3.8 |
| වතු | 15,035 | 11,440 | 2.1 | 4.1 |


## ගෘහ ඒකක වියදම

සමීක්ෂණයේදී ගෘහ ඒකක වියදම ලබා ගැනීම සමීක්ෂණ උපලේඛනයේ ප්‍රධාන කාණ්ඩ 3 ක් යටතේ සිදු කරනු ලබයි.

1. ආහාර සඳහා වන වියදම්
2. ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වන වියදම්
3. ගෘහ ඒකකයේ නේවාසිකයින් සහ ගෘහ සේවකයින් විසින් දරන ලද වියදම්

නිරවද්‍ය සහ ගුණාත්මක දත්තයන් ලබා ගැනීම පහසු කරවීම් වස් විවිධ පරිභෝජන භාණ්ඩ මිලදී ගැනීම් සඳහා විවිධ වූ යොමු කාලයන් භාවිත කරනු ලබයි. එනම්, ආහාර සඳහා සතියක වියදමද, නිවාස, ඉන්ධන හා ජල විදුලි වැනි වියදම් සඳහා මාසික වියදමද, ඇඳුම් පැළඳුම් සඳහා මාස 06 ක වියදමද, කල් පවතින භාණ්ඩ මිලදී ගැනීම් සඳහා මාස 12 ක වියදමද යනාදී වශයෙනි.

**රූපය 4 : ශ්‍රී ලංකාවේ ආහාර හා ආහාර නොවන ද්‍රව්‍ය අතර අනුපාතිකය - 2012**




වගුව 7 න් නිරූපනය වන පරිදි 2012 වසරේ ශ්‍රී ලංකාවේ මධ්‍යන්‍ය ගෘහ ඒකක වියදම රු. 40,887කි. එයින් රු. 15,358 (38%) ක්ම ආහාර සඳහා වූ වියදම්ය. මුළු වියදමෙන් 62% ක් එනම් 25,529 ක් ආහාර නොවන ද්‍රව්‍ය හා සේවා සඳහා වූ වියදම් බව ඇස්තමේන්තු විය.

අංශයන් අතර ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වූ වියදම් සංසන්දනය කිරීමේදී නාගරික හා ග්‍රාමීය අංශවල ජනතාව ආහාර සඳහා වැය කල වියදමට වඩා වැඩි මුදලක් ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වැය කර ඇති බවට තොරතුරු අනාවරණය විය. නමුත් වතු අංශයේ ජනතාව, ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වැය කල වියදම ආහාර සඳහා වැය කල වියදමට බොහෝ සේ සමාන විය.

2009/10 සමීක්ෂණයෙන් වාර්තාවූ මධ්‍යන්‍ය ගෘහ ඒකක වියදම රුපියල් 31,331 ක් වූ අතර, 2012 සමීක්ෂණයේදී 30.5% කින් වර්ධනයවී තිබිණි.

**වගුව 7 : ගෘහ ඒකකයක මධ්‍යන්‍ය (සාමාන්‍ය) මාසික වියදම - 2012**

| අංශය | මධ්‍යන්‍ය වියදම (රු.) | ආහාර පාන සඳහා වියදම (රු.) | * ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වියදම (රු.) |
|---|---|---|---|
| **ශ්‍රී ලංකාව** | **40,887** | **15,358** | **25,529** |
| නාගරික | 59,001 | 18,513 | 40,487 |
| ග්‍රාමීය | 37,561 | 14,704 | 22,857 |
| වතු** | 29,779 | 14,779 | 15,000 |

** මත් වතුර, මත් ද්‍රව්‍ය හා දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය ඇතුළුව*

*** රජයේ හා පෞද්ගලික අංශ ඇතුළුව*

$$\text{ආහාර වියදම් අනුපාතිකය} = \frac{\text{ආහාර පාන සඳහා වූ වියදම}}{\text{මුළු වියදම}} \times 100$$

2012 දී ආහාර සඳහා මධ්‍යන්‍ය වියදම, ආහාර නොවන ද්‍රව්‍ය සඳහා මධ්‍යන්‍ය වියදම පිළිවෙලින් රු. 15,358 ක් සහ රු. 25,529 ක් වන අතර, 2009/10 වර්ෂ සමග සසඳන විට ආහාර පාන සඳහා 15.8% ක් සහ ආහාර පාන නොවන ද්‍රව්‍ය සඳහා 41.3% ක වැඩිවීමක් දක්නට ඇත.

අංශයන් තුල සාමාන්‍ය මාසික ගෘහ ඒකක වියදම සංසන්දනය කළවිට 2009/10 සමීක්ෂණයේදී නාගරික අංශයේ සාමාන්‍ය මාසික ගෘහ ඒකක වියදමට වඩා 2012 සාමාන්‍ය මාසික ගෘහ ඒකක වියදම 31.3% ක වැඩිවීමක් පෙන්නුම් කරන අතර, වතු අංශය තුල එම අගය 24.1% ක වර්ධනයක්ද පෙන්නුම් කරයි.

එම කාල පරාසය තුල ග්‍රාමීය අංශයේ ගෘහ ඒකකයක පරිභෝජන වියදම 28% ක වැඩිවීමක් නිරීක්ෂණය කළහැක.

පාදක වර්ෂය 2006/07 වශයෙන් ගෙන පිළියෙල කරන ලද කොළඹ පාරිභෝගික මිල දර්ශකය අනුව ගැලපීමෙන් උද්ධමනයේ බලපෑම ඉවත්කොට ගණනය කරන ලද මූර්ත ගෘහ ඒකක වියදම රු. 24,631 ක් ලෙස ඇස්තමේන්තු විය. 2009/10 වසරට සා-පේක්ෂව එය 8.5% ක වර්ධනයකි.


2009/10 සිට 2012 තෙක් සමීක්ෂණ කාල වකවානුව තුල අංශයන් අතර ගෘහ ඒකක මූර්ත වියදමෙහි වෙනස නිරීක්ෂණය කිරීමේදී නාගරික අංශය තුල ගෘහ ඒකක මූර්ත වියදම 9.2% කින්ද වර්ධනයක්වී ඇති බව දක්නට තිබූ අතර ග්‍රාමීය අංශයෙන් 6.1% කින් හා වතු අංශයෙන් 3.2% කින් ගෘහ ඒකක මූර්ත වියදම් වැඩිවීමක් වාර්තාවේ. වතු අංශය හැරුණ කොට ඉතිරි අංශ දෙකෙන් ගෘහ ඒකක මූර්ත වියදම 2006/07 සිට 2009/10 වසර දක්වා ස්වල්ප වශයෙන් අඩුවී ඇත. වතු අංශයේ ජනතාවගේ 2006/07 සිට 2009/10 දක්වා වැඩි වියදමක් වාර්තාවීමට ප්‍රධානම හේතුව වන්නේ එම කාලය තුල ඔවුන්ගේ වැටුප් හා වේතන වැඩිවී තිබීමයි. (රූපය 5)

**වගුව 8 : අංශ අනුව මධ්‍යස්ථ ගෘහ ඒකක වියදම - 2012**

| අංශය | මධ්‍යස්ථ වියදම (රු.) |
|---|---|
| **ශ්‍රී ලංකාව** | **30,051** |
| නාගරික | 42,811 |
| ග්‍රාමීය | 28,331 |
| වතු | 25,580 |


ශ්‍රී ලංකාවේ ගෘහ ඒකක මූර්ත වියදම 2006/07 සිට 2009/10 දක්වා 1% කින් අඩුවී ඇත. එනමුත් 2009/10 සිට 2012 සමීක්ෂණ කාලවලදී ගෘහ ඒකක මූර්ත වියදම අංශ තුනෙහිම තරමක් වැඩිවී ඇත.

**රූපය 5 : සාමාන්‍ය මාසික මූර්ත ගෘහ ඒකක වියදම (2006/2007-2012)**




## ආහාර ද්‍රව්‍ය සඳහා වියදම් රටාව

**රූපය 6 : තෝරාගත් ආහාර ද්‍රව්‍ය කිපයක සාමාන්‍ය මාසික ඒක පුද්ගල පරිභෝජන රටාව - 2006/07-2012**




යම් කාලයක් තුල පරිභෝජන රටාවේ වෙනස්වීම් අධ්‍යයනය කිරීමට එක් මාර්ගයක් නම්, එම කාල වකවානු තුල විවිධ සංරචක සඳහා ඒක පුද්ගල පරිභෝජන ප්‍රමාණයන් සහ මුළු වියදමින් ඒවා සඳහා වැයවූ කොටස් නිරීක්ෂණය කිරීම හා සංසන්දනය කිරීමයි. ඒ අනුව 2006/07 සිට 2009/10 හා 2012 වසර වන විට විවිධ වූ අයිතමයන් සඳහා පරිභෝජන රටාවෙහි සිදුවූ අඩු වැඩිවීම් රාශියක්ම පෙනෙන්නට තිබිණි.

2012 දී වාර්තාවූ ශ්‍රී ලංකාවේ ගෘහ ඒකකයක සාමාන්‍ය මාසික ආහාර පරිභෝජන වියදම රුපියල් 15,358 කි. මාසික ඒක පුද්ගල කැකුළු සහල් පරිභෝජනය, ඒක පුද්ගල නාඩු සහල් සහ සම්බා සහල් සමග සසඳන කල වඩා වැඩි ප්‍රමාණයක් පරිභෝජනය කරන බව 09 වන වගුවෙන් අනාවරණය කෙරේ.

2009/10 මාසික ඒක පුද්ගල කැකුළු සහල් පරිභෝජනය කි. ග්‍රෑ. 4.1 ක් වුවද, 2012 දී එය 3.7 දක්වා අඩුවී ඇත. 2009/10 සිට 2012 වසර දක්වා නාඩු සහල් පරිභෝජන-යේ සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය කළ නොහැකි වුවත්, සම්බා සහල් සහ පරිප්පු පරිභෝජනයේ වැඩිවීමක් නිරීක්ෂණය කළ හැක.

2009/10 සිට 2012 දක්වා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා වන ඒක පුද්ගල පරිභෝජන රටාව නිරීක්ෂණය කිරීමේදී පැහැදිලිව පෙනෙන්නට තිබෙන කරුණු කිපයක් මෙසේය.

**වගුව 9 : තෝරාගත් ආහාර ද්‍රව්‍ය කිපයක් සඳහා මාසික ඒක පුද්ගල පරිභෝජනය - 2009/10 - 2012**

| | | 2009/10 | | 2012 | |
|---|---|---|---|---|---|
| අයිතමය | ඒකකය | ප්‍රමාණය | වටිනාකම (රු.) | ප්‍රමාණය | වටිනාකම (රු.) |
| සහල් (කැකුළු) | ග්‍රෑම් | 4127 | 244 | 3698 | 197 |
| සහල් (නාඩු) | ග්‍රෑම් | 3278 | 210 | 3288 | 196 |
| සහල් (සම්බා) | ග්‍රෑම් | 1643 | 119 | 1787 | 125 |
| තිරිඟු පිටි | ග්‍රෑම් | 687 | 47 | 559 | 51 |
| පාන් (සාමාන්‍ය) | ග්‍රෑම් | 1266 | 106 | 939 | 118 |
| පරිප්පු | ග්‍රෑම් | 501 | 99 | 578 | 93 |
| ලොකු ලූණු | ග්‍රෑම් | 582 | 45 | 579 | 47 |
| සිනි | ග්‍රෑම් | 1212 | 113 | 1104 | 117 |
| පොල් | ගණන | 7 | 184 | 7 | 204 |

පාන් පිටි. පාන් සහ සිනි පරිභෝජනය අඩුවී තිබෙන අතර, සහල් පරිභෝජනයේද වෙනසක් සිදුවී නැති බවත්, පොල් සහ ලොකු ලූණු පරිභෝජන රටාවෙහිද සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැති බවද කිව යුතුව ඇත.

## ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වියදම

සෑම ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණයකින්ම අනාවරණය වූ පරිදි ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වන වියදමට විශාල අගයක් එකතු වූයේ නිවාස සඳහා වූ වියදම් හේතුවෙනි. තමාගේම නිවසක් හෝ කිසිඳු කුලියක් හෝ ගෙවීමක් නොකරන නිවසක් වෙනුවෙන් ඇස්තමේන්තු කරන ලද කුලී වටිනාකමද ගෘහ ඒකකයේ නිවාස සඳහා වන වියදමට ඇතුලත්කර ඇත.

වගුව 10න් පැහැදිලි වන පරිදි ආහාර නොවන ද්‍රව්‍ය සඳහා යන වියදමෙන් 26.8% ක්ම වෙනත් වියදම් මෙන්ම, අහඹු ලෙස අධික වියදමක් දැරීමට සිදුවන වියදම්ද ඇත. එනම් යොමු කාලය තුල (පසුගිය මාස 12 තුල) විටින් විට හෝ එක් වතාවක් හෝ සාමාන්‍යයෙන් සිදුවූ විවාහ, අවමංගල, ආගමික ආදී ඕනෑම සමාජ හෝ සංස්කෘතිකමය කටයුත්තක් සඳහා වැය කළ වියදම් මේ යටතට ගණන් ගැණින. සේවා නියුක්තික අරමුදල්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම අරමුදල, වෘත්තීය සමිති සාමාජික මුදල්, සුබ සාධක සංගම් දායක මුදල්/වැඩිහිටි සමාජ දායක මුදල්, රක්ෂණ/අග්‍රහාර සහ වෙනත් ඉතිරි කිරීම් (සීට්ටු මුදල්), ණය ගෙවීම්, මුදල් ණයට දීම, ආදායම් බදු ගෙවීම්, උත්සව තෑගි, ආධාර, නිවසේ අලුත්වැඩියා හෝ නඩත්තු කටයුතු. නිවාස දේපල, මිලදී ගැනීම් හෝ නව නිවාස ඉදිකිරීම් යන සියළු වියදම් මේ යටතේ ගණන් ගැණෙනු ලැබ ඇත.

2009/10 හා 2012 සමීක්ෂණ ප්‍රතිඵල අනුව ආහාර නොවන ද්‍රව්‍ය සඳහාවු වියදම් සසඳා බැලිමේදී නිවාස, පණිවුඩ හුවමාරුව, මත්වතුර, මත්ද්‍රව්‍ය හා දුම්කොල වියදම්

**වගුව 10 : ප්‍රධාන ආහාර නොවන ද්‍රව්‍ය කාණ්ඩ සඳහා සාමාන්‍ය මාසික වියදම 2009/10 - 2012**

| | 2009/10 | | 2012 | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු.) | (%) | වටිනාකම (රු.) | (%) |
| ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වන මුළු වියදමෙහි එකතුව | **18,064** | **100.0** | **25,529** | **100.0** |
| නිවාස | 3,446 | 19.1 | 4,533 | 17.8 |
| ඉන්ධන හා ආලෝකය | 1,278 | 7.1 | 1,724 | 6.8 |
| සෞඛ්‍ය හා පෞද්ගලික අවශ්‍යතා | 1,429 | 7.9 | 2,228 | 8.7 |
| ප්‍රවාහනය | 2,317 | 12.8 | 3,607 | 14.1 |
| පණිවුඩ හුවමාරුව | 755 | 4.2 | 891 | 3.5 |
| අධ්‍යාපනය | 1,018 | 5.6 | 1,430 | 5.6 |
| ක්‍රීඩා, විනෝද හා සංස්කෘතික කටයුතු | 402 | 2.2 | 546 | 2.1 |
| නිවාස ඒකකයේ කල් නොපවතින භාණ්ඩ හා සේවා | 362 | 2.0 | 552 | 2.2 |
| රෙදිපිළි සහ පාවහන් | 903 | 5.0 | 1342 | 5.3 |
| දිගුකල් පවතින භාණ්ඩ | 780 | 4.3 | 1099 | 4.3 |
| වෙනත් වියදම් | 4,709 | 26.1 | 6,837 | 26.8 |
| මත්වතුර, මත්ද්‍රව්‍ය, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන | 665 | 3.7 | 738 | 2.9 |

ප්‍රතිශතය 2012 වසරේදී අඩුවීමක් පෙන්නුම් කරන අතර, ප්‍රවාහනය, සෞඛ්‍ය හා පුද්ගලික අවශ්‍යතා සඳහා වූ වියදම්වල ප්‍රතිශතයන්හි වැඩිවීමක් පෙන්නුම් කරයි. අනෙකුත් ආහාර නොවන ද්‍රව්‍ය සඳහාවු වියදම් ප්‍රතිශතයේ විශාල වෙනසක් පෙන්නුම් නොකරයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
109, රොටුන්ඩා ටවර්, ගාලු පාර
කොළඹ 03
දුරකථන: 0112147000

දුරකථන : 011-2508689
ෆැක්ස් (Fax) : 011-2508690
ඊ මේල් : sample.survey@statistics.gov.lk

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

නියැදි සමීක්ෂණ අංශය,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
8 වැනි මහල,
"යුනිටි ප්ලාසා" ගොඩනැගිල්ල,
කොළඹ 04.

*වෙබ් අඩවිය*
***www.statistics.gov.lk***

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ**
**දැක්ම හා මෙහෙවර**

### දැක්ම

**දේශයේ සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දෙන්නවුන් අතරින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම.**

### මෙහෙවර

**ගෝලියකරණ පසුබිමක් තුල සමෘධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශිලි නායකත්වය තුළින් වඩාත් ඵලදායී අයුරින් කාලීන වූත්, නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායකවීම.**